මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය
Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone
மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்
මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය
Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| සිංහල සාහිත්‍ය රසාස්වාදය | 11 ශ්‍රේණිය | කාලය : පැය 03යි |
|---|---|---|

**ශිෂ්‍යයාගේ නම :-** .............................................................................................................................

⁎ I කොටසෙහි 1,2 ප්‍රශ්නවලටත් , II කොටසෙහි 3 වැනි ප්‍රශ්නයටත් , III කොටසෙහි 4, 5, 6, 7 ප්‍රශ්නවලින් තෝරා ගත් ප්‍රශ්න **දෙකකටත්** උත්තර සපයන්න.

## I කොටස

(01) (i) සිට (v) තෙක් කොටස් කියවා, ඒවා ඇසුරෙන් අසා ඇති (අ), (ආ) ප්‍රශ්නවලට **කෙටි උත්තර** ලියන්න.

(i) ''එහෙයින් මේ මා කළ දෙයට නුඹ වහන්සේ ම ක්ෂමා කොට වදාළ මැනවැ''

(අ) මෙහි 'මා' යනුවෙන් හැඳින්වෙන්නේ කවරෙක් ද?

(ආ) මෙහි ' නුඹ වහන්සේ ' යනුවෙන් ආමන්ත්‍රණය කෙරෙන්නේ කාට ද?

(ii) '' මා ගිහිවීමෙහි ආලයෙක් නැතැ''

(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?

(ආ) මෙසේ පවසන්නේ කා හට ද?

(iii) ''ඈ නිකටට අත තබාගෙන නිසලව සිටියා ය.''

(අ) මෙහි 'ඈ' යනුවෙන් දක්වා ඇත්තේ කවු ද?

(ආ) මෙම පාඨය උපුටා ගත් කතා පුවතේ කතුවරයා නම් කරන්න.

(iv) ''සුදු වලා කුළු බෝ මැ අහස් කුසේ
ඉහළ යෙයි; ඔබ යැම පහත් වැ මැ යි
එ පුදුමෙක් ද? උසස් නැණවත් දනෝ
ගුණ බරින් නැමුණෙ 'වි පවතිත් නිතින් ''

(අ) මුල් දෙපදයේ අර්ථ පැහැදිලි කරන්න.

(ආ) ඉරි ඇඳි පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.

(v) '' ඩහදිය හෙළන අය හිරිහැර අතර වැටී
දකුණේ මෙන් ම උතුරෙත් හැම තැනම සිටී
විමසා බලමි ඔවුනගෙ හදවතෙහි හැටී
කළුගල් යකඩ නො ව උණු වී හැළෙන ඉටී ''

(අ) මෙම කවිය ඇතුළත් පැදි පෙළේ රචකයා කවරෙක් ද?

(ආ) ''කළුගල් යකඩ නො ව උණු වී හැළෙන ඉටී '' යන්නෙන් මතු කෙරෙන අර්ථය කුමක් ද?

**( මුළු ලකුණු 04 × 5 = 20යි)**

(2) . පහත දී ඇති පැදි පෙළ කියවා අසා ඇති ප්‍රශ්න උපයෝගී කොට ගෙන **රසාස්වාදයක්** ලියන්න.

එක් යුගයක ජීවනයේ සරතස නිවූ මා සුමිතුර
දුර හිඳිනා ඔබ දකින්න ආයෙමි දිගු කලකට පසු

බමන විදුලි පංකාවෙන් වා ගැබ කැළඹෙන හඬ මිස
එ සඳ ඔබේ මුව 'ග නැගුණු සාද තෙපුල් නෑසේ මට

මේසය මත ලිපි ගොනු රැස සුළඟෙ නොයා දී රකිමින්
ඒ මත සිටිනා ගල සේ මා අබියස නිහඬය ඔබ

බිත්තියේ ඇති සේයා රූ එකිනෙක එබී එබී බලයි
නැතියෙන් ඔබෙ වත හසරැලි මදෙස බලා සිනා නගයි

බාලේ අපි ගම් දොර කෙළි මඬුලු මැදින් ආ ගමනේ
මහදේ ඇඳි ඔබෙ සිතුවම කොහි සැඟවිණි දැයි නොදැනේ

එක් යුගයක ජීවනයේ සරතස නිවූ මා සුමිතුර
ඔබ අසලින් බැහැරට යමි කුමට ද ඔබගේ අවසර

(i) මෙම පද්‍ය පන්තියේ තේමාව කුමක් ද?

(ii) මෙම පැදි පෙළ සඳහා කවියා යොදා ගෙන ඇති ආකෘතිය කුමක් ද?

(iii) කවියාගේ කවි සිතිවිලි අවදිකළ අතීත සිදුවීම් **දෙකක්** විස්තර කරන්න.

(iv) කවියා අත්දැකීම් ප්‍රබලව ඉදිරිපත් කිරීමට යොදා ගත් යෙදුම් **දෙකක්** උපුටා දක්වන්න.

(v) කවියා යොදාගත් භාෂාව රස නිෂ්පත්තිය උදෙසා කොතෙක් දුරට ගැළපේ ද?

**( මුළු ලකුණු 25යි)**

# II කොටස

පහත දැක්වෙන ගද්‍ය - පද්‍ය කොටස් දෙකින් **එක කොටසකට පමණක්** උත්තර සපයන්න.

(3). ''එසඳ ප්‍රභාවතී පිය රජ්ජුරුවන්ගේ බස් අසා නඟුන් හා පරිවාර ස්ත්‍රීන් විසින් පිරිවරා බෝධිසත්ත්වයන් සිටි තෙනට ගියා ය. කුසරජ්ජුරුවෝ ද මෙහෙ කරමින් සිට ප්‍රභාවතීන් තමන් කරා එන නියාව දැන, '' දැන් මම මැගේ මන් බිඳ මාගේ පාපිට මඩෙහි ම වැද හොවමි '' යි සිතා වළන්වල තිබූ පැන් බිම නමා කලවිටක් පමණ තැන් පාගා බොරකොට බොරමඩයෙහි සිටියාහු ය. එකල ප්‍රභාවතී ගොස් බෝධිසත්ත්වයන්ගේ පත්ලෙහි ඉස තබා මහ පවනින් මුලින් උපුටා එලන ලද ස්වර්ණ තාලස්කන්ධයක් පරිද්දෙන් මඩෙහි වැතිර, තමාගේ සුරක්තපල්ලවාභිරාම වූ මෘදුකෝමල පාණි යුගලයෙන් බෝධිසත්ත්වයන්ගේ තරුණාරුණ කිරණ සම්පර්කයෙන් ප්‍රවිකසිත වූ සන්ධ්‍යාරාග නිර්විශේෂ ප්‍රභා භාසුර පාදපද්මයුගලය අල්වා ගෙන මරණ භයින් පීඩිත ව මහ හඬින් හඬහඬා '' දේවයන් වහන්ස මාගෙන් වෙන්ව නුඹ වහන්සේ විසින් රාජ්‍ය ශ්‍රීවිභූතිය හැර අපමණ දුක්ඛයෙන් යම් පමණ කලක් ඉක්මවන ලද ද එපමණ කාලයක් මුළුල්ලෙහි මා විසිනුත් දුර්භෝජන දුක්ඛසෙය්‍යාදීන් හා ස්නානපාන රහිත වීමෙන් නුඹවහන්සේ සේ ම දුකින් ම දවස් යවන ලද්දේ ය. එහෙයින් මට නොකිපී ක්ෂමා කොට වදාළ මැනව.

තව ද මහ රජ්ජුරුවන් වහන්ස, මාගේ සත්‍ය වචනයක් ඇසුව මැනව. මම මෙතැන් පටන් දිවිහිමියෙන් කයින් වචසින් මනසින් අමනාපයක් නොසිතමි, නොකරමි ඉදින් මා මෙසේ යාඥා වෙමින් සිටිය දී මට ක්ෂමා නොකොට මාගේ බස් නොපිළිගත් සේක් වී නම් දැන් මපියාණන් වහන්සේ මෙසත් රජදරුවන්ට මා සත් කඩක් කොට කපා දෙන සේක. එහෙයින් මට ක්ෂමා කොට රක්ක මැනවැයි යාඥා කළාය.''

(i) කුස රජතුමා බොරමඩයෙහි සිටියේ ඇයි?

(ii) බොහෝ රතු පාට ලා දලුවක් බඳු දෑත්වලින් පබාවතිය කුසරජතුමාගේ පාද යුගල අල්වාගත් බව කියැවෙන අවස්ථාව ඡේදයෙන් උපුටා ලියන්න.

(iii) පබාවතිය ද කුස රජු සේම දුකින් කාලය ගත කර ඇති බව ප්‍රකාශ කරන අවස්ථා දෙකක් ඉදිරිපත්

(iv) පූර්වෝක්ත ඡේදයෙන් කියවෙන පරිදි පබාවතීට කුස රජුගෙන් සමාව නොලැබුනහොත් කුමක් සිදුවේ ද?

**( මුළු ලකුණු 05 + 05 + 05 + 10 = 5යි)**

### නැතහොත්

ගන්තුන තුලානේ අලියා වැටුණු වැවේ
සුන්දර හාමි එතරම් පොහොසතෙක් නොවේ
තුන්ලාහකම බිම වැඩකර දියෙන් වැවේ
රන්වන් කරල් බරවී දැන් බිමට නැවේ

ඔහුගේ ගමට මා ගිය ඒ පළමු වර
තවමත් සිතේ ඇත අමතක නොවන යුර
හේනට ගොසින් ගෙන් හූවක් තරම දුර
එනවා දිටිමි මිටි බැඳගෙන වියලි දර

දරටික තබා සෙවණැති පලු ගසක යට
පිස දම දමා දාඩිය එන නළල පිට
මා එන තුරුම සිට පෙන්වූ සිනහ කට
තවමත් පෙනේ දුක් දොම්නස් අතර මට

පෙර දැක නොමැති මුත් සුන්දර හාමි විසින්
මගෙ තොරතුරු ඇසූ හැටි හිතවතකු ලෙසින්
ගෙඩියක් කඩාගෙන ගෙමිදුල තැඹිලි ගසින්
පිළිගැන්වීය මට සොම්නස පිරුණු ඇසින්

පොල් දෙහි දොඩම් ගස් තුන හතරකි වත්තේ
දුප්පත් කමයි හැමතැන ලකුණුව ඇත්තේ
කෙලෙසද කියා කළ ගුණ සැලකිය යුත්තේ
දුන් සත පණහවත් ඔහු නැත පිළි ගත්තේ

ආගන්තුකව එන කෙනෙකුට පුරුදු නැති
හිතවත් කමින් සැලකු යුතුකමය සිතී
ඔහු වෙත මුදලකින් මා කළ හැටිය තුතී
සිහිවී මගේ කම්මුල රතු පැහැය ගතී

(i) මෙම පැදි පෙළට වස්තු විෂය වී ඇති අත්දැකීම කෙටියෙන් විස්තර කරන්න.

(ii) නිර්මාණයේ සාරවත්භාවයට පද්‍ය ආකෘතිය හේතු වී ඇත. විමසන්න.

(iii) තම අත්දැකීම් ප්‍රබලව ඉදිරිපත් කිරීම සඳහා කවියා පුද්ගල වර්ණනා යොදා ගෙන ඇති ආකාරය පහදන්න.

(iv) කවියා ලැජ්ජාවට පත් වූයේ ඇයි?

**(මුළු ලකුණු 05 + 05 + 05 + 10 = 25යි)**

## III කොටස

මෙම කොටසේ ප්‍රශ්න දෙකකට පමණක් උත්තර සපයන්න.

(එක් උත්තරයකට වචන 150ක් වත් තිබිය යුතුය.)

(4). අවස්ථා නිරූපණයේදී කතුවරයා දැක්වූ ප්‍රතිභාව කතා පුවතේ රසවත්භාවයට හේතු වී ඇති අන්දම ''නන්ද වස්තුව'' ඇසුරෙන් උචිත උදාහරණ තුනක් යොදාගෙන විමසන්න.

**මුළු ලකුණු 15යි**

(5). තේමාවට උචිත භාෂා භාවිතය '' වැස්ස'' කවි පෙළේ විශේෂත්වයකි. උචිත උදාහරණ තුනක්වත් දෙමින් විමසන්න.

**මුළු ලකුණු 15යි**

(6). ''උතුරෙන්'' පද්‍ය පන්තිය තාත්වික වීම සඳහා කවියා යොදා ගෙන ඇති කාව්‍යෝක්ති හේතු වී ඇත. නිදසුන් තුනක් ඇසුරෙන් විමසන්න.

**මුළු ලකුණු 15යි**

(7). අර්ථ රසය හා භාවාත්මක හැඟීම් ඉස්මතු වන පරිදි සජීවී ආකාරයෙන් දෙබස් නිර්මාණය කර තිබීම '' වැලපීම'' කෙටි කතාවේ සාර්ථකභාවයට හේතු වී ඇත. උචිත උදාහරණ ඇසුරෙන් විමසන්න.

**මුළු ලකුණු 15යි**